# මොරටුව විශ්වවිද්‍යාලය
# ශ්‍රී ලංකාව

# පුරප්පාඩු

මොරටුව විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. ඖෂධවේදී (පහළ ශ්‍රේණිය)

**අවශ්‍ය සුදුසුකම් :**

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව පිළිගත් ඖෂධවේදී වශයෙන් සුදුසුකම්ලත් සහතිකයක් ලබා තිබීම.

**වයස** : අවුරුදු 45ට නොවැඩි විය යුතුයි.

**** වැටුප් ක්‍රමය :**

රු.31,625-7X300;10X355-37,275/- (මාසික)
U-MT$_1$(IIIA)

**බඳවා ගන්නා ක්‍රමය :**

සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 02. මහජන සෞඛ්‍ය පරීක්ෂක (111 ශ්‍රේණිය)

**අවශ්‍ය සුදුසුකම් :**

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ විභාගය සමත් වී තිබීම.

**වයස** : අවුරුදු 45ට නොවැඩි විය යුතුයි.

**** වැටුප් ක්‍රමය :**

රු.31,625-7X300;10X355-37,275/=(මාසික)
U-MT$_1$(IIIA)

**බඳවා ගන්නා ක්‍රමය :**

සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**** මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනාවන් ද ගෙවනු ලැබේ.**

සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2022.02.11 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ මෙම විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරී/ආයතන (අනධ්‍යයන) වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

තවද මේ සඳහා අදාළ ආදර්ශ අයදුම්පත්‍රය මෙම විශ්වවිද්‍යාලයේ ආයතන (අනධ්‍යයන) අංශයේ, සහකාර ලේඛකාධිකාරී නමට ලිපිනය ලියූ රු.45.00 ක මුද්දර ඇළ වූ සෙ.මී. 25.5 X සෙ.මී.10 ප්‍රමාණයේ ලිපි කවරයක් එවීමෙන් හෝ පැමිණ හෝ මොරටුව විශ්වවිද්‍යාලයේ www.mrt.ac.lk. වෙබ් අඩවිය මගින් ලබාගත හැකිය.

උසස් අධ්‍යාපන ආයතනයන්හි, රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් එවීමට කටයුතු කළ යුතු වේ.

ප්‍රමාද වී ලැබෙන, අවශ්‍ය විස්තර සඳහන් නොකළ, අපැහැදිලි හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොමැති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේ අයදුම්පත් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා වුවද එම අයදුම්පත නැවත සැළකිල්ලට භාජනය කරනු නොලැබේ.

**ලේඛකාධිකාරී,**
**මොරටුව විශ්වවිද්‍යාලය, මොරටුව.**
**2022.01.24**